# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

අංක 2394/39 - 2024 ජූලි මස 24 වැනි බදාදා - 2024.07.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: RUW/LAN/ACQTN/A2/257.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/9/2017/WS/83.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/ පරවශතාව ලබා ගැනීමට රජය අදහස් කරන බැව් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය (1) වැනි උපවගන්තිය යටතේ, මෙයින් දැනුම් දී සිටිමි.

*මහජන කටයුත්ත කුමක්ද යන වග*:- රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විසල් රුවන්වැල්ල ජල යෝජනා ක්‍රමයේ 450m$^3$ ධාරිතාවෙන් යුතු ජල ගබඩා ටැංකියට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීම.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර*:-

සබරගමු පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 100B සියඹලාවල ග්‍රාම නිලධාරි වසමේ සියඹලාවල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක 610436 හා 2024.04.30 දිනැති කැඩැස්තර සිතියමේ සවිස්තරව දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0211ක් වූ පහත සඳහන් බිම් කැබලි.

01. කැබලි අංක 1
ඉඩමේ නම: පීටර්හිල්වත්ත; හිමිකම් කියන්නා: බී. ධර්මලතා; ප්‍රමාණය: හෙක්. 0.0029.

02. කැබලි අංක 2
ඉඩමේ නම: පීටර්හිල්වත්ත; හිමිකම් කියන්නා: රජය, ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර අංක 507512 මත ආර්. එම්. සමිත විරාජ් සෙනෙවිරත්න විසින් වගා කර ඇත; ප්‍රමාණය: හෙක්. 0.0159.

03. කැබලි අංක 3
ඉඩමේ නම: පීටර්හිල්වත්ත; හිමිකම් කියන්නා: බී. ධර්මලතා; ප්‍රමාණය: හෙක්. 0.0015.

04. කැබලි අංක 4
ඉඩමේ නම: පීටර්හිල්වත්ත; හිමිකම් කියන්නා: රජය, ආර්. එම්. සිරිල් අනවසරයෙන් භුක්ති විඳී; ප්‍රමාණය: හෙක්. 0.0008.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ

**2024 ඔක්තෝබර් මස 14** වැනි දින පෙ.ව. 10.00ට රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුයි.

තවද **2024 සැප්තැම්බර් මස 30** වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්,එකී ඉඩම පරවශ්‍යතාවට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබදව විස්තරත්,වන්දි මුදල සහ ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. අයිතිවාසිකම් තහවුරු කිරීමට ඇති ඔප්පු සහ අනෙකුත් ලියවිලි ද පරීක්ෂණ දිනයේ දී ඉදිරිපත් කළ යුතුයි.

**එච්. ඩී. එස්. එන්. හෙට්ටිගේ,**
ප්‍රාදේශීය ලේකම්,
රුවන්වැල්ල.

2024 ජූලි මස 17 වැනි දින,
රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0234

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.